

# ඉස්සර ගම හා ගැමියා

(මාර්ටින් වික්‍රමසිංහ ගේ "උපන්දා සිට" ඇසුරිනි)

. . . තුට්ටු තුනක් ගෙවා හාල් සේරුවක් හා තුට්ටු හයක් ගෙවා රෙදි යාරයක් ද ගත් කාලයෙහි සතුටින් ජීවත් වූ ගැමියෝ මුදලට ගිජු නොවූහ. අනික් බොහෝ ගැමියන්ට මෙන් අන්දිරිස් ගුරුන්නාන්සේට ද ගෙදර ඉඩමේ ගස් වලින් කැමට උවමනා පොල් ද, එළවළු කොටුවෙන් එළවළු පළාකොළ ද අමු මිරිස් ද ලැබිණ. ඔහු මුදල් ගෙවූයේ හාල්, ලුණු, මිරිස්, කරවල, ජාඩි හා මාළු ද ගනු පිණිස ය. ගැමියෝ අළුත් මාළුවලට වඩා කරවල වලටත්, ජාඩිවලටත් ප්‍රිය කළෝ ය. අලුත් මාළු රාත්තලක් වුවමනා පවුලකට ජාඩි කරවල නම් කාලක් පමණ පිය. ජාඩි හෝ කරවල හෝ සමඟ බත්, දෙල්, කොස් බෙහෙවින් අනුභව කළ හැකි ය.

...කිතුල් පැණිත් සමඟ කටෙහි තබා ගන්නා කැකිරි ඇබිත්ත කටත් දිවත් සීසිල් කරමින් දියව විසිරෙන්නේ කටට ගත් හිමකිරම් පිඩකටත් වඩා ලෙහෙසියෙනි. දීකිරින්, පැණින් තරම් කැකිරි රසවත් නො වුව ද මා හැම දෙයකට වඩා අගය කළ කෑමකි. ඉදුණු කැකිරි ගෙඩියෙහි සිනිඳුව හා කහපාටත්, පිපුරුණු විවරයන් ගෙන් පෙනුණු සුදුවලා වැනි මදයෙහි සිනිඳුවත් අන්දෙ අයියා ගෙන් ඇසූ 'කැකිරි ඇටයේ කතාවත්' නිසා එය අද්භූත ඵලයක් ලෙස මම සැලකුවෙමි.

...පන්දු ගසා පැරදුණුවුන්ට ජල්ලි දමන කොළු මිත් ගේ ඝෝෂාව හැර අනික් කෑමුර ගැඹුරින් තොරවූ ගමේ ඇතැම් ගෙවලින් පොල් කටුවේ උඩ කවඩි වැටෙන හඬ නික්මෙයි. ගැමියන් හඬින් ගයන සොමනස් ගීයට තාලය වයන වීනා කයිනාලම් කාරයන් මෙන් කුරුල්ලෝ හඬ පතුරති.

...ගැමියෝ හැම සතුන් ඉවසූහ. හැම සත්තු ගැමියන් ඉවසූහ. දෙගොල්ලම ගමෙහි ජීවත් වූයේ හෑ සබඳකම විසින් ඔවුනොවුන් කෙරෙහි බැඳුණවුන් ලෙසිනි. ගැමියන් බලූ පැටියන් හා

බළල් පැටියන් ශෙනැවීත් ඇති නොකරන නමුදු හැම ගෙදරකම බල්ලෝ දෙතුන් දෙනෙක් ද බළලෙක් ද වෙසෙති. උන් ඉපිද වැඩෙන්නේ ගැමි ගෙදරක බිතක්කන අසල දර මඩුවෙහි ය. ලොකු උණු පසු ඒ බල්ලෝ එකා දෙන්නා බැගින් ගැමි ගෙවල වාසයට යති.

...අප අප ගේ එළදෙනුන් තුන් දෙනාගෙන් එකියක ගෙදරට දක්කා ගෙන ඇවිත් සාත්තු කෙළේ ඈ පැටියකු වැදූ විට පමණි. අනික් කාලයේ එළදෙන්නු ගම පුරාත් බැදි වැදීත් ඇවිද තණ කා ගැමි ගෙදරක පිළිකන්නෙහි හෝ ගස් සෙවණක හෝ රැය ගත කරති.

... ගොයම් පෝර සුලබ වීම නිසා ගැමියන් ගේ ඉඩම්වල කුරුමිණියෝත් උන් කා ජීවත් වන තලගොයිත් බහුල වූහ. වැහි කාලයේ වතුර හිරෙන අගලක පීනු කිඹුලකු තරම් විශාල කබරෙක් ඇතැම් විට අගලෙන් ගොඩ වී පාර හරහා අඩියෙන් අඩිය තබමින් බඩගායි. අපි දිග රිටි වලින් උගේ පිටට ශැසීමෙන් හීලෑ කරන ලද විල් සතකු සමඟ ශපාර බැදීමෙන් ලබන ප්‍රීතිය වැනි ප්‍රීතියක් ලැබීමු.

... මා උගැන්ම සඳහා පන්සලට ගියේ මාත් මගේ නෑ සහෝදරයන් දෙදෙනෙකුත් තවත් දරුවන් තිදෙනෙකුත් පමණි. පොත් කියවීමෙන් පසු පන්සලෙන් නික්ම යන අප මහ පාරට බසින තැන දකුණු පැත්තේ පාළු අම්බලමක් විය. එය කවුගෙයක් මෙන් අප ගේ සිත් ගත්තේ ය. ඇතැම් දවසක අප එහි ඇතුළු වන විට ලැග සිටි ගවයෙක් නැගී පාරට පැන වල්ගය උඩට නගාගෙන දුවයි. හැම විට මට මේ සිවුපදයක් අවුරුද්දක් පාසා කුඹල්කාරයන් තැශි පිණිස ගෙනෙන වළන් කදත් සිහි විය.

"අම්බලමේ පිනා     පිනා
වළන් කදක් ගෙනා     ගෙනා
ඒක බිදපි ගොනා     ගොනා
ඒකට මට හිනා     හිනා"

... අපේ ගමේ සිට මහින් පටවා ගෙන ගාල්ලට එන තිරික්කල කාරයන් ගේ ගාල වූ කලිරුම්ස්සල කඳු පාදයත්, පාලමත් අසල වූ කඩවතයි. හැමී තිරික්කල කාරයන් ගෙන එන මහින් නගරයේ තිරික්කල කාරයෝ කොවුව තෙක් ගෙන යති. ගැමියන් ශෙන් වැඩි දෙන කඩවකින් බැස පයින් නගරයට යති. තාත්තා ද කඩවත සිට ගාල්ලේ කොටුවට ගියේ පයිනි. ඉතා දුකසේ මුදල් සැපයු ගැමියෝ බොරු මානය නොදත්හ. පයින් ඇවිදීම ඔවුන් ගේ සන්තෝෂයට හේතු විය.

... ආගමත් ගැමි සමාජයත් අත්වැල් බැඳ ගන්වන විහාරස්ථානය එලොවත් මෙලොවත් එක්කරන තැනකි. ගමේ පන්සලෙහි වෙඩි පින්කම ආගමත් ගැමි සමාජයත් එක්කරන්නකි. පන්සලේ පවත්වන ලද කිඳුරු නැටුම ශ්‍රව්‍ය කාව්‍යයට නඟන ලද බණ කථාවක් විය. පන්සලේ මිදුල එවැනි ශ්‍රව්‍ය කාව්‍යයකට උචිත රඟ බිමක් විය. කිඳුරාගේත් කිඳුරියගේත් පක්ෂි වේශය ගනු පිණිස ගැමි කලාකාරයෝ පිදුරු ඉණ හැද වහල් කොට ගත්හ. මැටි පහන් වැටින් එළිය වුණු ස්තූපය, විහාරගෙය හා බෝරුක ද කිඳුරු නැටුමට පිටි පසින් තබන ලද පෙකිකඩ සිත්තමකට සමාන විය.

"කිඳුරා ලගින්නේ ඔබඩ කැදූල්     ලේ
කිඳුරි ලගින්නේ කිඳුරගෙ තුරුල්     ලේ"

ආලය අද්භූත හැඟීමත් ලෙස සලකන්නට මේ දෙපාදය ගැමි තරුණයන්ටත්, තරුණියන්ටත් අනුබල දුන්නේය.

... සෙනසුරාද උදය වරුවේ පිටත් වන අප මයිල බාගයක් පමණ ගම්සබා පාරෙහි ගොස් බසින්නේ අතුරු පාරකටය. එතැන් සිට පොල් රුප්පා වසා හෙවුණු කැලෑ රොදවල් මැදින් යන අප පිවිසෙන්නේ මූකළාණක් මැදින් වැටුණු අඩි පාරකට ය. වියළි පරණල පෑගෙන හඬ අසන කොංඩ කුරුල්ලෝ ඉගිලී කැලය තුළට වදිති. කහ කුරුල්ලා ඉගිලී පියාඹන්නේ අහ ගලක් ගැසුවෝ තිනි. පණුගිරවූ මිනිස් ගඳ ඇසුවත් මෙන් අප ළංවන්නට පෙර ඉගිලී අතුරුදහන් වෙති. රුක්කඳට කොටන කැරලෙක් අප දෙස බලා හයියෙන් සිනාසෙන්නාක් මෙන් හඬනගා පලායයි.

... පිටියෙහි එක් පැත්තක වූ ගොයම් පීදෙන තරම වැඩුණකි. ලින් කඳ හැර අනික් තුන් පැත්ත, අඩියක් පමණ උස් වූ ගල්වැටකින් වට වුණු ළිඳෙහි සිසිල් දිය උතුරා පිටවෙයි. අහසෙහි

නිල දවන තරම් කුරිරු ඉරෙහි රස්නය මඳ සුළඟ නිසා අපට නොදැනෙයි. අප සතියක් පාසා වැව්ලි හේනට ඇවිත් නාන්නේ මේ ළිඳෙනි.

... ගස් කොළන් හා මූකළාන් බහුල ගමෙහි දැඩි අඳුරු අහුමුළු සුලබය. පොල්තෙල් පහනින් එළිය කෙරෙන ගෙවල ද අහුමුළු අඳුරුය. රැයෙහි උලම්මු හඬති. කන කොක්කු හඬති. බකමූණා නහන්නේ මෙලොව නොව පරලොව සිහි කරවන හඬකි.

... ලද දෙයින් තුටුව ජීවත් වූ ගැමියෝ විශ්‍රාමයෙන් කාලය ගෙවන්නෝ වූහ. ආහාරපාන, රෙදිපිළි ඉතාම අඩු මිළට ලැබුණු බැවින් ගැමියෝ උදය පටන් හවස් වන තෙක් වැරවෑයමින් වැඩ කරන්නෝ නොවූහ. වැඩ අඩුවීම නිසා ගැමියෝ විනෝදයෙන් කාලය ගෙවීමටත්, අලස සුව විඳිම ටත් පුරුදු වූහ. මුදල් ඔට්ටු නොකොට හත් දිවි යන් කෙළින, නිරංචි කෙළින, මැද වියෙහි වූවන් පමණක් නොව, මහලු ගැමියන් ද ගමෙහි කඩ පිළක් මිදුලක් පාසා දකින්නට ලැබුණේ කලාතුර කින් නොවේ. ගැමියන් ගේ මඟුල්කෑම වනාහි ඔවුන් සතු විශ්‍රාමය, ලද දෙයින් තුටුව ජීවත් වීම, සහල්, ලුණු මිරිස් එලවුළු ආදී ආහාර වර්ග ඉතාම අඩු මිළට ලැබීම යන තුන අනුව පැවැත්වෙන උත්සව විය. දිළිඳු ගැමිගෙදරක වුව ද, විවා මඟුල නිමිති කොට 'මඟුල් දීම' නමින් නෑ මිතුරන් උදෙසා පැවැත් වෙන සංග්‍රහයක් විය. ඉඩම් හිමි ගැමියෝ මේ සංග්‍රහය දවස් දෙක තුන, ඇතැම් විට සතියක් තිස්සේ පැවැත් වූහ.

...... උදය කාලයේ ගම මැදින් ගමන් කරන් නකුට, ගිනි උදුනක් ඉදිරියෙහි වාඩි වූ මහලු ස්ත්‍රියක් සහිත කුඩා ඉස්තෝප්පුවකින් යුත් පැලක් දකින්නට ලැබේ. ආප්ප පුළුස්සන ගිනි උදුනට ටිකක් ඈතින් හැළියක් තබන ලද තවත් ගිනි උදුනකි ............... කුඩා බංකුවක් මත වාඩි වී කෝපි කෝප්පයක් අතින් ගත් සරමක් ඇඳ සරමක් කරට දමා ගත් මහල්ලෙක් ද, දිග බංකුවක් මත වාඩි වී ආප්ප පුළුස්සන තෙක් බලා සිටින ගම් වැස්සන් දෙතුන් දෙනෙක් ද දකින්නට ලැබෙත්. ............

(බන්දුල ශ්‍රී සරච්චන්ද්‍රගේ "අපේ සංස්කෘතික උරුමය හා ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථි පරිසරය" ඇසුරනි)

ශ්‍රී ලංකාවේ පැරණි ගම් පිහිටා තිබුණේ එකි නෙකට වෙන්වූ ඒකක වශයෙනි. 'ගම' යන වචනය එක් ස්ථානයක පිහිටි ඉඩම් පංගු රාශියක සංහතාවක් වශයෙන් හැඳින්විණ. මෙසේ හුදකලා ඒකක වශයෙන් හිමි වූ ගම් මහනුවර සමය වන විට කෝරළයකට අයත් පත්තුවක එක කොටසක් බවට පත්වී තිබිණ.

එකල පැවැති ගම් වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීම සඳහා විශේෂයෙන් වෙන් කරන ලද මායිම් නො තිබුණු නමුත්, එක ගමකින් තවත් ගමක් වෙන් කර ගැනීම සඳහා ගැමියෝ විශේෂ යෙන් දැන සිටියහ. 'ගමේ කමට' සැලකීම එද මෙන් අදත් ගම්බද ප්‍රදේශවල මුල් බැසගෙන තිබෙන ආවේණික ධර්මතාවයකි. වෙනත් ගමකින් තවත් ගමකට අවුත් පදිංචි වූවකු හඳුන්වන්නේ 'පිටගම් කාරයකු' ලෙසිනි.

'ගම එක් විශාල කුඹුරු යායකින් ද වල් බිහි වුණු හේන් බිම් කොටස කින්ද, කටුමැටි ගැසූ කුඩා ගෙවල් ගණනාවකින් ද, ගෙවතු රාශියකින්ද පොදු තණ බිමකින් ද, ජල පහසුකම් සලසන කුඩා වැවකින් හෝ ජලාශය කින් ද යුක්ත විය. කුඹුරු යාය, පුද්ගලයකුගේ හෝ පවුලක හෝ පරම් පරාගත උරුමය අනුව කොටස්වලට බෙද තිබිණ. සේවයක් වශයෙන් රදළයන් සඳහා මුත්තෙට්ටුව නම් කොටස ද, වගා කළ අතර, අනෙක් කොටස් නිල පංගුව වශයෙන් හැඳින්විණ.

හවුල් ඉඩම් අයිතිය ග්‍රාමීය සමාජයේ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණයක් විය. ගමේ පිහිටි මුළු වෙල් යාය ම පොදු අයිතියට යටත් ව පැවතිණ. සියලු දෙනාම සාමූහිකව වැඩ කිරීනෝ තම තමන් වෙනුවෙන් නියමිත පංගු බෙද ගත්හ. මේ අනුව එද ගම ස්වයංපෝෂිත ඒකකයක් වශයෙන් පැවැති අතර ගැමියන්ට අවශ්‍ය දේ ගමේ ම නිපදවා ගත්හ.

කුඩා ජනගහනයකින් යුක්තවීම, වැඩි ඥාති සම්බන්ධතා පැවතීම, සරල ශ්‍රම විභජනයකින් යුක්තවීම, එකිනෙකා කෙරෙහි පෞද්ගලිම දැන හැඳුනුම්කම් පැවතීම, කුඩා ජනගහනයකින් යුක් තවීම, ඉක්මනින් වෙනස් නොවන සමාජ ඇගයීම් මුල්බැස තිබීම, පැරණි ගමක දක්නට ලැබුණු සම්ප්‍රදයික ලක්ෂණය.